28 DEC 2020

# ජාතික හෙළ උරුමය ව්‍යවස්ථාව

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## පටුන


| | |
|---|---|
| පළමු වගන්තිය | - නම |
| දෙවන වගන්තිය | - පක්ෂයේ ලාංඡනය |
| තුන්වන වගන්තිය | - පක්ෂයේ ප්‍රතිඥාව |
| හතරවන වගන්තිය | - පක්ෂයේ දැක්ම |
| පස්වන වගන්තියේ | - පක්ෂයේ ප්‍රතිපත්තිය |
| හයවන වගන්තිය | - පක්ෂයේ සංවිධාන ව්‍යුහය |
| හත්වන වගන්තිය | - පක්ෂයේ නිළධාරීන් |
| අටවන වගන්තිය | - උපදේශක සභාව |
| නවවන වගන්තිය | - මධ්‍යම කාරක සභාව |
| දහවන වගන්තිය | - ගණ පූරණය හා තීරණවල වලංගුතාවය |
| එකළොස්වන වගන්තිය | - ජාතික මණ්ඩලය |
| දොළොස්වන වගන්තිය | - මහජන නියෝජිත මණ්ඩලය |
| දහතුන්වන වගන්තිය | - පක්ෂයේ ජාතික මහා සම්මේලනය |
| දහ හතරවන වගන්තිය | - පක්ෂ සාමාජිකත්වය |
| පහළොස්වන වගන්තිය | - පක්ෂයේ විනය |
| දහසයවන වගන්තිය | - පක්ෂයේ දේපල හා මූල්‍ය කටයුතු |
| දාහත්වන වගන්තිය | - ව්‍යවස්ථා සංශෝධනය |
| දහඅටවන වගන්තිය | - අන්තර් කාලීන විධිවිධාන |
| දහනවවන වගන්තිය | - පෙර ව්‍යවස්ථාව පරිච්ඡින්නවීම |
| උපලේඛන | |


28 DEC 2020


ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## ජාතික හෙළ උරුමය ව්‍යවස්ථාව

**01. නම**

පක්ෂයේ නම ජාතික හෙළ උරුමය වේ. (එය මින් පසු පක්ෂය යනුවෙන් සඳහන් කරනු ලැබේ)

**02. ලාංඡනය**

පළමු උපලේඛනයේ දැක්වෙන හක්ගෙඩිය (සංඛය) වේ.

**03. ප්‍රතිඥාව**

පක්ෂයේ සෑම සාමාජිකයකුම දෙවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව ලබාදිය යුතුය. පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පළාත්සභා මන්ත්‍රීවරු ඇතුළු සියලු මහජන නියෝජිතයින් තෙවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව ලබාදිය යුතුය.

**04. පක්ෂයේ දැක්ම**

ශ්‍රී ලංකාව ධර්ම රාජ්‍යයක් බවට පත්කිරීම. ඒ සඳහා බෞද්ධ දේශපාලන චින්තනය උපයෝගී කරගනිමින් ජනතාවට මගපෙන්වීම හා සංවිධානයවීම.

**05. පක්ෂයේ ප්‍රතිපත්ති**

පක්ෂයේ ප්‍රතිපත්ති පහත සඳහන් පරිදිවේ.

5.1 ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැගීම බෞද්ධ ධර්ම ප්‍රතිපත්තීනට අනුව සිදුවිය යුතුය. සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම ඒකීය රාජ්‍යයේ වගකීම විය යුත්තේය. බෞද්ධ නොවන සෙසු සියලු ආගම් හා ඇදහීම්වලට බාධාවකින් තොරව නිදහසේ සිය ආගම හෝ ඇදහීම සිදුකරගෙන යෑමේ අයිතිය සුරක්ෂිත කළයුතුය. සදාචාර විරෝධී ලෙස බලය යොදාගෙන සිදුකරන ආගම් වලට හරවා ගැනීම නීතිවිරෝධී බව පිළිගත යුතුය.

5.2 ශ්‍රී ලංකාව බෙදා වෙන්කළ නොහැකි ඒකීය රාජ්‍යයකි. ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරීත්වය හා ජාතික ආරක්ෂාව අනුල්ලංඝනීය කොන්දේසියක් වන අතර එයට තර්ජනයක් එල්ල වන අවස්ථාවලදී රටේ ව්‍යවස්ථාවට අනුව එය තහවුරු කිරීම සඳහා දේශපාලන මැදිහත්වීම් වලින් තොරව ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට පූර්ණ අධිකාරිය ලැබිය යුතුය.

5.3 රටක ජාතික අයිතිය පවතින්නේ එරට ජනාවාස කර ශිෂ්ඨාචාරය සංස්කෘතිය හා රාජ්‍ය ගොඩනැගූ ජනකොටසටය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික අයිතිය ඇත්තේ සිංහල ජාතියටය. සිංහලයින්ගේ ජාතික අයිතිය තහවුරු කරන අතර සිංහල නොවන වෙනත් ජනවර්ගයන්ගේ අයිතීන්ද මැනවින් ආරක්ෂා කළයුතුය. ධර්මාශෝක අධිරාජයාණන් බෞද්ධ දැක්ම මුල්කොට ගොඩනැගූ ධර්ම රාජ්‍යයේ සංකල්පයන්ට අනුව "සබේ මුනිසෙ මම පජා" (සියලු රටවැසියෝ මාගේ දරුවෝය) යන සංකල්පය මත පිහිටා සියලු ජනකොටස් අරභයා කටයුතු කිරීම පාලක පක්ෂයේ පරමාදර්ශනය වියයුතුය.

5.4 රාජ්‍ය පරිපාලනය ග්‍රාම රාජ්‍ය සංකල්පයට අනුව විමධ්‍යගත කළයුතු අතර නිදහස් ජන අදහස් වලට ඉඩදෙන ජනසම්මතවාදී දස රාජ්‍ය ධර්මය මත පදනම්වූ රාජ්‍ය පාලනයක් පවත්වාගත යුතුය.

5.5 මහාකරුණා සංකල්පය පදනම් කරගෙන ගහකොළ සතාසීපාවාද වත්මන් හා අනාගත මානව සංහතියද අජීවී ස්වභාව ලෝකයද ඒකාත්මික කරගත් චිරස්ථායී සංවර්ධන රටාවක් ඇතිකළ යුතුය.

5.6 තන්හාව වෙනුවට සියලු ජනයාගේ අවශ්‍යතා ඉටුකරන ධාර්මික ජාතික ආර්ථිකයක් ගොඩනැංවිය යුතුය. දේශීය දැනුම ජනතාව සහ සම්පත් පදනම් කරගත් ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

5.7 වානිජත්වයට හා දුසිරිතට ගොදුරුවූ බෙදීගිය සමාජයක් වෙනුවට ගිහි - පැවිදි, ස්ත්‍රී - පුරුෂ, ගුරු - ගෝල, දෙමාපිය - දූදරු, අඹු - සැමි, පාලක - පාලිත, ස්වාමි - සේවක, වෙළඳ - පාරිභෝගික ආදී සමාජ සබඳතා සුචරිතය මත එක්තැන් කළ අන්‍යෝන්‍ය යුතුකමින් බැඳීගිය ධාර්මික සමාජයක් ඇතිකළ යුතුය.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

5.8 ශ්‍රී ලංකාවේ සංස්කෘතික පරිසරයටත් නවලොව අවශ්‍යතාවයන්ටත් ජාතික සංවර්ධනයටත් ගැලපෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රමයක් සකස් කළයුතුය. දේශීය වෙදකම හා දැනුමට සමතැන ලැබෙනා සුවසේවාවක් හා විද්‍යා තාක්ෂණයක් බිහිකරගත යුතුය. නගර නිර්මාණය, ඉදිකිරීම් හා ප්‍රවාහන සේවාවන් වලදී පරිසර හිතකාමී බලශක්තීනට ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර වෙරළ වැසි වනාන්තර හා ජීව විවිධත්වය පිළිබඳ අපේ උරුමය සුරක්ෂිත කොට පෝෂණය කළයුතුය. වාණිජත්වයට විජාතික සංස්කෘතියට හා අවශ්‍යතා වලට යට නොවුනු නිදහස් මාධ්‍ය ප්‍රතිපත්තියක් පවත්වාගත යුතුය.

5.9 ධර්ම සංඝායනාවක් පවත්වා සිංහල භික්ෂු වංශය නැවතත් සක්‍රිවය ස්ථාපනය කළයුතු අතර 1957 සහ 2002 බෞද්ධ කොමිෂන් සභා මගින් නිර්දේශිත ශාසනික යෝජනා කාලානුරූපව ක්‍රියාත්මක කළයුතුය. ශ්‍රී ලංකා රාජ්‍යය තුළ භික්ෂුවගේ උපදේශන හා අධ්‍යාත්මිකවූ කාර්ය භාරය ස්ථාපිත කළයුතුය.

5.10 අතීතයේ අපරට ලොවපුරා බුදු දහම පැතිරවූ ධර්මද්වීපය විය. එබැවින් සහෝදර බෞද්ධ රටවල් සමඟ බෞද්ධ ජාත්‍යන්තරයක් ගොඩ නැංවිය යුතුය. එමෙන්ම අප අසල්වැසි කලාපයේ රටවල් වලට ප්‍රමුඛත්වය දෙන සෙසු සියලු රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වන දේශයේ නිවහල්තාවය සුරැකෙන සාමානාත්මතාවය පදනම් කරගත් විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළයුතුය.

## 06. පක්ෂ සංවිධාන ව්‍යුහය

පක්ෂ මධ්‍යම මණ්ඩල වලින් හා අනුමණ්ඩල වලින්ද ප්‍රාදේශීය සංවිධාන වලින්ද සමන්විතවේ.

### 6-1 මධ්‍යම මණ්ඩල

6-1-1 උපදේශක සභාව

6-1-2 මධ්‍යම කාරක සභාව

6-1-3 ජාතික මණ්ඩලය

6-1-4 ජාතික මහා සම්මේලනය

6-1-5 මධ්‍යම කාරක සභාව නම්කරන කමිටුවක් මඟින් සාමාජිකයින්ගේ විනය පිළිබඳ කටයුතු කෙරේ.

### 6-2 ප්‍රාදේශීය සංවිධාන

ප්‍රාදේශීය සංවිධානවල ව්‍යුහය සංවිධාන අනුමණ්ඩලය විසින් සකස් කර මධ්‍යම කාරක සභාව විසින් අනුමත කළයුතුය. ප්‍රාදේශීය සංවිධාන මෙසේවෙයි.

6-2-1 දිස්ත්‍රික් ජනසභාව

6-2-2 ආසන ජනසභාව

6-2-3 පර්ෂද ජනසභාව

6-2-4 ගම් ජනසභාව

6-2-5 ආයතන හෝ විද්වත් සභා

## 07. පක්ෂයේ නිළධාරීන්

පක්ෂ සභාපති, මහලේකම්, ජාතික සංවිධායක, නියෝජ්‍ය සභාපති, නියෝජ්‍ය ලේකම්,භාණ්ඩාගාරික සහ උපදේශක සභාවේ ප්‍රධානී යන අය පක්ෂයේ නිළධාරීන්වේ.

සත්‍ය පිටපතකි

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

7-1 සභාපති

7-1-1 සියලුම සභාවල මුලසුන දැරීම සභාපති විසින් සිදුකරන අතර සභාපති නොමැති අවස්ථාවක උපදේශක සභාවේ ප්‍රධානී හෝ එහි සාමාජිකයෙකුට එහි මුලසුන දැරීමට අයිතිය ඇත. ඒ කිසිම නිළධාරියෙකු නොමැතිවූ විට පමණක් මහලේකම් මුලසුන දැරිය යුතුය.

7-1-2 ජාතික අනුමණ්ඩලය කැඳවීම සහ එහි අනුමණ්ඩල අතර කටයුතු සම්බන්ධීකරණය, ප්‍රගති සමාලෝචනය සභාපති විසින් සිදුකරනු ලැබේ.

7-1-3 මහජන නියෝජිත මණ්ඩලය කැඳවීම සහ එහි කටයුතු අධීක්ෂණය කිරීමද සභාපතිගේ කාර්යභාරයකි.

7-1-4 මධ්‍යම කාරක සභාවේ තීරණ අනුව ආගමික හා සමාජසේවා සංවිධාන සමඟ පක්ෂයේ සබඳතා පවත්වාගෙන යාම හා ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාව දැනුවත් කිරීම සභාපති විසින් සිදුකරයි.

7-2 මහලේකම්

7-2-1 මධ්‍යම කාරක සභාවේ වාර්තා පවත්වාගෙන යෑම.

7-2-2 පක්ෂයට අයත් සියලුම වැදගත් ලිපි සුරක්ෂිතව පවත්වාගෙන යෑම.

7-2-3 පක්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කිරීම.

7-2-4 අනෙකුත් බාහිර ආයතන සංවිධාන සහ පුද්ගලයින් සමඟ පක්ෂය වෙනුවෙන් ලිපි ගනුදෙනු කිරීම.

7-2-5 පක්ෂයේ තීන්දු මත මධ්‍යම කාරක සභාව සහ ජාතික මහා සම්මේලනය කැඳවීම.

7-2-6 පක්ෂ මූලස්ථානයේ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.

7-2-7 පක්ෂයේ සංවිධාන ව්‍යුහයන්හි මනා ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පසුබිම සැකසීම ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.

7-2-8 උපදේශක සභාව, මධ්‍යම කාරක සභාව, ජාතික මහා සම්මේලනය යන ආයතනයන්හි රැස්වීම්වල මුලසුන දැරීම.

7-2-9 මධ්‍යම කාරක සභාවේ තීරණ අනුව අනෙකුත් දේශපාලන පක්ෂ සමඟ පක්ෂයේ සබඳතා පවත්වාගෙන යාම හා ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාව දැනුවත් කිරීම.

7-2-10 අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හිදී උපදේශක සභාව හෝ මධ්‍යම කාරක සභාව කැඳවීම

7-2-11 විනය කඩකිරීම පිළිබඳ චූදිත සාමාජිකයෙකු වැරැද්ද පිළිගෙන සමාව අයැද එම වැරැද්ද යළි නොකරන බවට දෙන ලිඛිත පොරොන්දු භාරගැනීම හා මධ්‍යම කාරක සභාවේදී සභාගත කිරීම.

7-3 ජාතික සංවිධායක

7-3-1 දිස්ත්‍රික් සංවිධානයන්හි කටයුතු අධීක්ෂණය ඒවායෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව වගකීම් දැරීම

7-3-2 ආසන බලමණ්ඩල හා ශාඛා සංවිධාන පිහිටුවමින් පක්ෂ ජාලය ව්‍යාප්ත කිරීම.

7-3-3 මැතිවරණ හා පක්ෂ සංවිධාන කටයුතු අනුමණ්ඩලයේ අනුශාසකත්වය දැරීම.

7-5-4 පක්ෂයේ අනුබද්ධ සංවිධාන පිහිටුවීම හා ඒවායෙහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.

7-5-5 මැතිවරණ අපේක්ෂකයින් තීරණය කිරීම සඳහා පත්කරන නාමයෝජනා කමිටුවේ සහ ආසන සංවිධායකයින් පත්කිරීමේ කමිටුවේ සභාපතිධූරය දැරීම.

ජාතික හෙළ උරුමය
964/2, ...

08. උපදේශක සභාව.

8-1 පක්ෂයේ මූලික අනුශාසනා මණ්ඩලය උපදේශක සභාව වේ. උපදේශක සභාව එහි ප්‍රධානී ඇතුළු භික්ෂූන් වහන්සේලා 05ට යටත්වේ.

8-2 උපදේශක සභාවේ සාමාජිකයන් පත්කිරීම ජාතික සම්මේලනයේදී සිදුකළ යුතුය. ධූර හා සාමාජික කාලය වසරකි.

8-3 පහත සඳහන් අවස්ථා වලදී උපදේශක සභාවේ සාමාජිකත්වය හෝ ධූර පුරප්පාඩුවේ.

8-3-1 ඉල්ලා අස්වීමේ ලිපිය මහලේකම් වෙත භාරදීමෙන්

8-3-2 ධූරකාලය අවසන්වීමෙන්

8-3-3 සාමාජිකයෙකු මියයාමෙන්

8-3-4 නිසි පරිදි අවසර නොගෙන අනුයාත රැස්වීම් තුනකට නොපැමිණීම හේතුවෙන් උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් නෙරපීමෙන්

8-3-5 නිදහසට කරුණු විමසීමෙන් පසුව ධූරයෙන් ඉවත් කිරීම සුදුසු බව මධ්‍යම කාරක සභාවේ තුනෙන් දෙකක බහුතරයෙන් සම්මතවීමෙන්

8-4 ධූරයක් හෝ සාමාජිකත්වයක් පුරප්පාඩුවූ විට එය මධ්‍යම කාරක සභාවේ රැස්වීමකදී දින 30ක් ඇතුළත පිරවිය යුතුය.

8-5 රැස්වීම්

8-5-1 උපදේශක සභාවේ රැස්වීම් අවම වශයෙන් මසකට වතාවක් කැඳවිය යුතුවේ.

8-5-2 පක්ෂ සභාපතිගේ නියමය අනුව හෝ අවම වශයෙන් උපදේශක සභාවේ සාමාජිකයින් 03 දෙනකුගේ ලිඛිතව කරන ඉල්ලමක් අනුව හෝ විශේෂ රැස්වීමක් කැඳවිය හැකිය.

8-5-3 රැස්වීම් පටිපාටිය හා රීති උපදේශක සභාව විසින් සකස්කර අනුමත කරගත යුතුය.

8-6 බලතල

8-6-1 පක්ෂයේ දර්ශනය සහ ප්‍රතිපත්ති පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය උපදෙස් පක්ෂයේ විවිධ මණ්ඩලවලට ලබාදීම.

8-6-2 පක්ෂ විනය හා ආචාර ධර්ම පිළිබඳව කාර්ය සංග්‍රහයක් අනුමත කිරීම.

8-6-3 පක්ෂයේ අනුමණ්ඩල වලින් මධ්‍යම කාරක සභාවට එන යෝජනා හා සමාජ ආර්ථික සංවර්ධන සැලසුම් හා ප්‍රතිපත්ති අධීක්ෂණය හා විමර්ශනය හා අදාල මණ්ඩලවලට මාර්ගෝපදේශනය ලබාදීම.

8-6-4 පක්ෂයේ ලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික උපදේශක සභාවේ සාමාජිකයින් නොවේ නම් සමස්ත සාමාජික සංඛ්‍යාවේ සරළ බහුතරයෙන් එකී ධූරවලට පුද්ගලයින් පත්කිරීම සිදුකළ හැක.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## 09. මධ්‍යම කාරක සභාව

පක්ෂයේ මූලික විධායක ආයතනය මධ්‍යම කාරක සභාවවේ.

### 9-1 සංයුතිය

මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව අවමය 20ක් ද උපරිමය 30ක් ද වේ.

9-1-1 පක්ෂයේ මූලික නිළධාරීන් හත්දෙනා

9-1-2 ජාතික මණ්ඩලයේ සියලු අනුමණ්ඩලයන්හි ලේකම්වරුන්

9-1-3 දිස්ත්‍රික්ක පදනමින් මධ්‍යම කාරක සභාව නියෝජනය කරන සෙසු සාමාජිකයින්

9-1-4 උපදේශක සභාවේ සෙසු සාමාජිකයින් 02

### 9-2 රැස්වීම්

9-2-1 මධ්‍යම කාරක සභාව සති දෙකකට වරක් රැස්විය යුතුය. සභාපති හෝ අවම වශයෙන් සාමාජිකයින් 13 දෙනෙකු හෝ කරන ලද ලිඛිත ඉල්ලීමකින් හෝ උපදේශක සභාවේ සම්මත වන යෝජනාවකින් හෝ විශේෂ රැස්වීමක් කැඳවිය හැක. රැස්වීම් කැඳවීම හා කාර්ය සංග්‍රහය මධ්‍යම කාරක සභාව විසින් සකස් කර අනුමත කළයුතුය.

9-2-2 ඉහත 9-2-1 හි දැක්වෙන අයුරින් මධ්‍යම කාරක සභා රැස්වීමක් කැඳවිය යුතුයැයි ඉල්ලා සිටින විට එකී ඉල්ලීම හෝ දැනුම්දීම කර දින 07ක් ඇතුළත මධ්‍යම කාරක සභාව කැඳවිය යුතුය.

### 9-3 බලතල

9-3-1 පක්ෂයේ සාමාජිකත්වය පිළිබඳ නිති පැනවීම හා සාමාජිකත්වය වර්ධනය කිරීම

9-3-2 පක්ෂයේ පරිපාලන නිළධාරීන් පත්කිරීම, බලතල නිර්නය කිරීම හා ඉවත් කිරීම

9-3-3 පක්ෂය වෙනුවෙන් නඩු පැවරීම

9-3-4 සාමාජික ලේඛණය යාවත්කාලීන කිරීම, නිරවද්‍යතාවය සහතික කිරීම හා කමිටුවලට ලබාදීම.

9-3-5 පක්ෂය සතු දේපොළ හා මුදල් භාරව සිටීම හා ඒවා ව්‍යවස්ථානුකූලව පාලනය කිරීම.

9-3-6 ආදායම සංවර්ධනය කිරීම, සුරක්ෂිත කිරීම හා නිසිලෙස උපයෝගී කරගැනීමට සැලැස්වීම සහ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම.

9-3-7 පක්ෂයේ වාර්ෂික වාර්තාව හා ප්‍රගති වාර්තාව පිළියෙල කිරීම හා එය ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කිරීම.

9-3-8 පාර්ශව සමඟ සම්මුති හා ගිවිසුම් ඇති කරගැනීම.

9-3-9 දෛනික දේශපාලන කටයුතුවලට අදාල ක්‍රියාමාර්ග අප්‍රහිතව ක්‍රියාවට නැංවීම.

9-3-10 පක්ෂ ප්‍රතිපත්ති වලට අනුකූලව ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, මෙහෙයවීම, සංවිධානය හා පාලනය

9-3-11 විනය කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

9-3-12 පක්ෂයේ ගිණුම් වාර්ෂිකව විගණනය කිරීම සඳහා විගණනකයෙකු පත් කිරීම

9-3-13 පක්ෂයට බැංකු ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑම.

9-3-14 පක්ෂය වෙනුවෙන් ණය ලබාගැනීම

9-3-15 පක්ෂය වෙනුවෙන් දේපල අත්පත් කරගැනීම සහ අන්සතු කිරීම

9-3-16 ආසන සංවිධායකවරු පත්කිරීම

**ජාතික හෙළ උරුමය**
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

9-3-17 මහජන නියෝජිත ආයතනයනිහි පක්ෂයේ නියෝජිතයින්ට දැරිය හැකි තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරිම

9-3-18 පක්ෂය ආණ්ඩුවක් පිහිටුවන්නේ නම් හෝ ආණ්ඩුවකට සම්බන්ධ වන්නේ නම් එයට හිමිවන ඇමතිධූර නියෝජ්‍ය ඇමතිධූර ඇතුළු විවිධ තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීම.

9-3-19 අවස්ථානුරූපීව තාවකාලික කාරකසභා කමිටු සහ අනුකමිටු පත්කිරීම

9-3-20 ජාතික මණ්ඩලය සම්බන්ධයෙන් පාලන බලතල හා කාර්යභාරය

(අ) ජාතික මණ්ඩලයේ අනුමණ්ඩලවලට සාමාජිකයන් පත්කිරීම, ඔවුන්ගේ බලතල නිර්ණය කිරීම

(ආ) ජාතික මණ්ඩලයේ නිළධාරීන් පත්කිරීම, නිළධාරීන්ගේ බලතල නිර්ණය කිරීම

(ඇ) ජාතික මණ්ඩලයේ ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම, ජාතික ඉලක්ක වාර්ෂික ඉලක්ක අනුමත කිරීම හා පසුවිපරම් කිරීම

(ඈ) එක් එක් අනුමණ්ඩල වල කාර්යභාරය වගකීම් නිර්ණය කිරීම

9-3-21 ජනසභා හා කමිටු සම්බන්ධයෙන් පාලන බලතල වගකීම් හා කාර්යභාරය

(අ) පක්ෂයේ කමිටු හා ජනසභා වල ක්‍රියාකාරීත්වය කාර්යභාරය හා වගකීම් පිළිබඳව නීතිරීති සැකසීම

(ආ) යාවත්කාලීන කරන ලද සාමාජික ලේඛනවල නිරවද්‍යතාවය සහතික කර ලබාදීම

(ඇ) ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම, ජාතික ඉලක්ක හා වාර්ෂික ඉලක්ක අනුමත කිරීම, ධූරාවලිය පහලට විමධ්‍යගත කිරීම හා පසුවිපරම් කිරීම.

(ඈ) පක්ෂයේ සාමාජිකත්වය වර්ධනය පිළිබඳව නිශ්චිත ඉලක්ක ලබාදීම ක්‍රියාමාර්ග නිර්ණය කිරීම පසුවිපරම් කිරීම.

## 10. ගණපූරණය හා තීරණ වලංගුවීම

10-1 උපදේශක සභාවේ ගනපූරණය නිළධාරී සාමාජිකයකු සමඟින් සමස්ත සාමාජිකයින් සංඛ්‍යාවෙන් 1/3කි.

10-2 මධ්‍යම කාරක සභාවේ ගනපූරණය නිළධාරීන් දෙදෙනකු සමඟින් සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් 1/3කි.

10-3 උපදේශක සභාවේ හෝ මධ්‍යම කාරක සභාවේ පුරප්පාඩු තිබියදී ගන්නා තීරණ වලද වලංගුභාවයක් ඇත්තේය.

10-4 මෙම ව්‍යාවස්ථාවේ අන්තැනක වෙනත් අයුරකින් සඳහන් යෝජනා සම්මත වනුයේ බහුතර ඡන්දයෙනි. යම් යෝජනාවකට පක්ෂව සහ විපක්ෂව සමානව ඡන්ද ලැබෙන අවස්ථාවක මූලාසනයට තීරක ඡන්දයක් හිමිවනු ඇත.

10-5 පක්ෂ ප්‍රතිපත්තියට එකඟවන්නාවූ හදිසි තීරණ වලට පක්ෂයේ නිළධාරීන් අතර තිදෙනෙකුට එක්වී තීරණ ගතහැකි අතර එය දින හතක් ඇතුළත උපදේශක සභාවේදී හා මධ්‍යම කාරක සභාවේදී අනුමත කරගත යුතුය.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## 11. ජාතික මණ්ඩලය

පක්ෂයේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමටත් අධ්‍යනයටත් පර්යේෂණ කිරීමටත් ගිහිපැවිදි දෙකොට්ඨාශයෙන්ම යුත් විවිධ ක්ෂේත්‍ර හා ප්‍රාදේශීය සංවිධාන ඒකාබද්ධ වන ආයතනය ජාතික මණ්ඩලයයි.

11-1 කාර්යභාරය

11-1-1 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් සහ සැලසුම් පක්ෂයේ ප්‍රතිපත්ති ලෙස පිළිගැනීමට පෙර ජාතික මණ්ඩලයේ අදාල අනුමණ්ඩලය තුළ සමාලෝචනය වියයුතුය.

11-1-2 ජාතික මණ්ඩලයේ තීරණ නොපමාව මධ්‍යම කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතුය.

11-1-3 ජාතික මණ්ඩලයේ අනුමණ්ඩල 14කි.

11-2 අනුමණ්ඩල

11-2-1 බුද්ධ ශාසන හා සංස්කෘතික අනුමණ්ඩලය

11-2-2 පක්ෂයේ අභ්‍යන්තර පරිපාලන අනුමණ්ඩලය

11-2-3 සංවිධාන කටයුතු අනුමණ්ඩලය

11-2-4 මුදල් කටයුතු අනුමණ්ඩලය

11-2-5 ජාතික ආරක්ෂාව හා නීති කටයුතු අනුමණ්ඩලය

11-2-6 ප්‍රචාරක අනුමණ්ඩලය

11-2-7 ජාත්‍යන්තර කටයුතු අනුමණ්ඩලය

11-2-8 ආර්ථික කටයුතු අනුමණ්ඩලය

11-2-9 වෘත්තීය කටයුතු අනුමණ්ඩලය

11-2-10 සමාජ කටයුතු අනුමණ්ඩලය

11-2-11 ක්‍රියාදරයින්ගේ අධ්‍යාපන හා පුහුණු අනුමණ්ඩලය

11-2-12 විද්‍යා හා තාක්ෂණ අනුමණ්ඩලය

11-2-13 පරිසර කටයුතු අනුමණ්ඩලය

11-2-14 තරුණ කටයුතු අනුමණ්ඩලය

11-3 අනුමණ්ඩලයේ සංයුතිය

11-3-1 උපදේශක සභාවේ සාමාජිකයකු අනුශාසකත්වය දරනු ඇත.

11-3-2 සභාපතිවරයෙක් හා ලේකම් ඇතුළුව මධ්‍යම කාරක සභාව විසින් පත්කරන සාමාජිකයින්

11-3-3 දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන ලෙස ඒ ඒ දිස්ත්‍රික්ක කමිටු විසින් නම්කර එවන නියෝජිතයින් (සංවිධාන අනුමණ්ඩලය හැර සෙසු අනුමණ්ඩලයන්හි සාමාජික සංඛ්‍යාව 25කි.)

11-4 පුරප්පාඩුවීම

පහත සඳහන් අවස්ථා වල සාමාජිකත්වය පුරප්පාඩු වේ.

11-4-1 ඉල්ලා අස්වීමේ ලිපිය ලේකම්ට භාරදීමෙන්

11-4-2 ධූරකාලය අවසන් වීමෙන්

11-4-3 සාමාජිකයෙකුගේ මරණයෙන්

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල

11-4-4 නිසි පරිදී අවසර නොගෙන අනුයාත රැස්වීම් තුනකට නොපැමිණීම නිසා මධ්‍යම කාරක සභාවේ සම්මත වන යෝජනාවකින්

11-4-5 අනුමණ්ඩලයකින් ඉවත් කරන යෝජනාවක් විනය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන්

11-4-6 පක්ෂ සාමාජිකත්වය අහිමිවීමෙන් හෝ සාමාජිකත්වයෙන් නෙරපා හැරීමෙන්

11-5 සාමාජික තනතුරක් හෝ ධූරයක් පුරප්පාඩුවී දින 30ක් ඇතුළත පත්කිරීම සිදුකළ යුතුය.

11-6 රැස්වීම්

11-6-1 ජාතික මණ්ඩලයේ සභාපතිත්වය උසුලන් ලබන්නේ ජාතික සංවිධායක විසිනි. සභාපති ජාතික මණ්ඩලයට සහභාගී වන්නේ නම් ඔහු හෝ ඇය මුලසුන උසුලනු ඇත.

11-6-2 අනුමණ්ඩල වල රැස්වීම් අවශ්‍යතාවය අනුව පවත්වනු ඇත. අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්විය යුතුය.

11-6-3 ජාතික මණ්ඩලයේ රැස්වීම් මාස තුනකට වරක් කැඳවිය යුතුය.

11-6-4 සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ රීති මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව පනවා ගැනීමට ජාතික මණ්ඩලයට බලය ඇත.

11-7 අනුමණ්ඩල නිළධාරින්ගේ වගකීම් හා බලතල

11-7-1 අනුමණ්ඩලයන්හි අනුශාසකයින්

(අ) අනුමණ්ඩලයේ කාර්ය භාරය වැඩසටහන් හා ප්‍රගතිය පිළිබඳව උපදේශක සභාවට වාර්තා කිරීම.

(ආ) උපදේශක සභාවේ නිර්දේශ අදාල අනුමණ්ඩල වලට ලබාදීම

(ඇ) විෂයානුබද්ධ අනුශාසනා අනුමණ්ඩලයට ලබාදීම.

11-7-2 අනුමණ්ඩල සභාපති

(අ) පක්ෂයේ දර්ශනයට හා ප්‍රතිපත්ති වලට අනුකූලව අනුමණ්ඩලයේ වැඩසටහන් සම්පාදනය කිරීම

(ආ) මධ්‍යම කාරක සභාවේදී අනුමණ්ඩලය නියෝජනය කිරීම

(ඇ) අනුමණ්ඩලයේ කළමණාකරන ක්‍රියාවලිය පවත්වා ගැනීම

(ඈ) මධ්‍යම කාරක සභාවෙන් පවරන කටයුත්තක් කිරීම

11-7-3 අනුමණ්ඩල ලේකම්

(අ) අනුමණ්ඩලයේ වාර්තා පවත්වා ගැනීම

(ආ) මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළයුතු වාර්තා සකස් කර අනුමණ්ඩල සභාපතිට භාරදීම

(ඇ) අවශ්‍ය අවස්ථාවල අනුමණ්ඩල සභාපති නියෝජනය කිරීම

(ඈ) අනුමණ්ඩලයේ රැස්වීම් කැඳවීම

(ඉ) මධ්‍යම කාරක සභාවෙන් පවරන කටයුත්තක් කිරීම

සත්‍ය පිටපතකි

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

11-7-4 අනුමණ්ඩලයේ ජ්‍යේෂ්ඨ සමාජිකයින්

අනුමණ්ඩලයේ ජ්‍යේෂ්ඨ සාමාජිකයින් මධ්‍යම කාරක සභාව විසින් නම් කරනු ඇත.

(අ) අනුමණ්ඩලයට සම්පත් දායකත්වය සැපයීම.

(ආ) පක්ෂයේ දර්ශනය හා ප්‍රතිපත්ති වලට අනුකූලව වැඩසටහන් සම්පාදනය කිරීම සඳහා මාර්ගෝපදේශනය

(ඇ) උපදේශක සභාව හෝ මධ්‍යම කාරක සභාවෙන් ඇරයුම් ලබන අවස්ථාවන්හීදී ඊට සහභාගීවීම

(ඈ) මධ්‍යම කාරක සභාවෙන් පවරන කටයුත්තක් කිරීම

11-7-5 අනුමණ්ඩල සමාජිකයින්

(අ) අනුමණ්ඩලයට අදාල ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යනය කිරීම හා වැඩසටහන් සකස් කිරීමට දායකවීම

(ආ) අනුමණ්ඩලයේ විෂයානුබද්ධ කාර්යයන්ට දායකවීම

(ඇ) රැස්වීම් වලට සහභාගීවීම

(ඈ) අනුමණ්ඩල සභාපති විසින් පවරන කටයුත්තක් කිරීම

11-8 ජාතික මණ්ඩලයේ වගකීම් හා බලතල

11-8-1 අනුමණ්ඩල වල ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ජාතික සැලසුම් ඒකාබද්ධ කරමින් පක්ෂයෙන් ජාතික සැලසුම් වාර්ෂිකව සකස් කිරීම හා ඉදිපත් කිරීම

11-8-2 පක්ෂයේ පොදු ප්‍රතිපත්ති ප්‍රකාශනය මධ්‍යම කාරක සභාවේ අනුමැතිය සඳහා පිළියෙල කර ඉදිරිපත් කිරීම.

11-8-3 ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කරනු ලබන පක්ෂයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් අධ්‍යනය කිරීම හා නිර්දේශ ලබාදීම

11-8-4 පහත සඳහන් කටයුතු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම

(අ) මැතිවරණ ප්‍රකාශනය

(ආ) මැතිවරණ කටයුතු සංවිධානය

(ඇ) මැතිවරණ කරන ආකාරය තීරණය

(ඈ) මැතිවරණ වලට තරඟ කිරීම

## 12. මහජන නියෝජිත මණ්ඩලය

12-1 පක්ෂයේ නියෝජනය කරන සියලුම මහජන නියෝජිතයන්ගෙන් මහජන නියෝජිත මණ්ඩලයක් සමන්විත වනු ඇත.

12-2 එකී මණ්ඩලය විසින් නම් කළ අයකු විසින් එහි ලේඛන තබනු ඇත.

12-3 පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු කණ්ඩායමක් ඇත්නම් ඔවුනට පාර්ලිමේන්තු කටයුතු හා ඊට අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙනමම රැස්විය හැක.

12-4 මෙම මණ්ඩලය හා එහි සාමාජිකයින් සාමුහිකව මෙන්ම තනිතනිවත් උපදේශක සභාවට හා මධ්‍යම කාරක සභාවට වගකිව යුතු අතර පක්ෂයේ අරමුණු වලට හා ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කළයුතුය.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

12-5 පාර්ලිමේන්තු මන්ත්‍රී ඇතුළු පක්ෂයේ සියලු මහජන නියෝජිතයින් ඔවුනට ලැබෙන විමධ්‍යගත අරමුදල් හා වෙනත් පහසුකම් පක්ෂයේ මධ්‍යම කාරක සභාව නිගමනය කරන සැලසුම් වලට හා නියමයන්ට අනුව යෙදවිය යුතුය.

## 13. ජාතික මහා සම්මේලනය

13-1 ජාතික මණ්ඩලයේ සාමාජිකයින් සහ එක් එක් දිසා සභාවේ ආසන ජනසභාවේ සමාජිකත්ව ශක්තිය සැලකිල්ලට ගෙන මධ්‍යම කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන එකී සභාවල සාමාජිකයින් යම් සංඛ්‍යාවක් ජාතික මහා සම්මේලනයට සහභාගී වියයුත්තේය.

13-2 එකී සම්මේලනය වාර්ෂිකව පැවැත්විය යුතුය.

13-3 පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය හා නව නිළධාරී මණ්ඩලය පිළිබඳව මධ්‍යම කාරක සභාව විසින් ගනුලබන තීරණ වාර්ෂික ජාතික මහා සම්මේලනයේදී අනුමත කළයුතුය.

13-4 පක්ෂ ලේකම්වරයා විසින් අවසන් වරට පැවැත්වූ ජාතික මහා සම්මේලනයෙන් පසු ගෙවුනු කාලය පිළිබඳ වාර්ෂික ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කළයුතුය.

13-5 ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කළ යෝජනාවක් ජාතික මහා සම්මේලනයේදී ඒකමතිකව සම්මත නොවුනහොත් ඒ සම්බන්ධයෙන් සම්මේලනයට සහභාගී වන සාමාජිකයින්ගේ ඡන්ද විමසීමක් පැවැත්විය යුතුය. එකී ඡන්ද විමසීම පැවැත්විය යුත්තේ පක්ෂ මහලේකම් විසින් නම්කරන සභාපති ඇතුළු උපදේශක සභාවේ සාමාජිකයින් පස්දෙනකුගේ අධීක්ෂණය යටතේය.

13-6 යම් වර්ෂයකදී පක්ෂයේ සම්මේලනයක් පැවැත්වීමට අපොහොසත්වීම නිසා යථාපරිදී සිදුකරන ලද මේ ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් ප්‍රකාරව පක්ෂයේ ඕනෑම නිළධාරියකු හෝ ආයතනයක් විසින් කරන ලද යම් ක්‍රියාවක් නිර්බල නොවන්නේය.

## 14. පක්ෂ සාමාජිකත්වය

14.1 පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීම.

14-1-1 වෙනත් දේශපාලන පක්ෂයක් සාමාජිකයෙකු නොවන පක්ෂයේ ව්‍යවස්ථාව සහ එහි අරමුණ පිළිගෙන පක්ෂ ප්‍රතිඥාව ලබාදෙන වයස අවුරුදු දහසය සම්පූර්ණ කළ ඕනෑම පුද්ගලයෙකු පක්ෂ සාමාජිකත්වය ලබාගැනීමට සුදුස්සෙකු වන්නේය.

14-1-2 යම් වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දරනු ලබන අයෙකු එකී දේශපාලන පක්ෂයෙන් ඉවත්වන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර ඇත්නම් ඔහුට ද පක්ෂ සාමාජිකත්වය ලබාගැනීමට අයදුම් කළ හැක.

14-1-3 පක්ෂ සාමාජිකත්වය අපේක්ෂා කරන අය විසින් ඒ සඳහා මධ්‍යම කාරක සභාව විසින් අනුමත කර ඇති ඉල්ලුම්පත් පුරවා ඒ සමග වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවිය යුතුය.

14-1-4 වාර්ෂික පක්ෂ සාමාජික ගාස්තුව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර සාමාජිකත්ව අයදුම්පතේ සදහන් කළ-යුතුය.

14-1-5 ඕනෑම අයෙකුගේ පක්ෂ සාමාජිකත්වය සඳහා වූ අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

14-1-6 යම් පුද්ගලයෙකුට පක්ෂ සාමාජිකත්වය ලබාදුන්නේ නම් ඒ බව එකී සාමාජිකයාට ලිඛිතව දැනුම් දිය යුතුය.

14-1-7 යම් පුද්ගලයෙකුට සාමාජික මුදල සමග සාමාජික අයදුම්පතක් ඉදිරිපත් කර නැතත් පක්ෂය විසින් ඉදිරිපත් කරන නාමයෝජනා පත්‍රයක අත්සන් තබා ඇත්නම් ඕනෑම කාර්යක දී හෝ අවස්ථාවක දී ඔහු පක්ෂ සාමාජිකත්වය අයදුම් කළා සේ සැලකේ. එකී නාමයෝජනා පත්‍රයට පක්ෂ ලේකම් විසින් අත්සන් තබා ඇත්නම් එකී සාමාජික අයදුම පිළිගෙන පක්ෂ සාමාජිකත්වය ප්‍රදානය කළා සේ සැලකේ.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

14-1-8 යම් පුද්ගලයෙකු සාමාජික මුදල් සමග සාමාජික අයදුපතක් ඉදිරිපත් කර නැතත් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට උපදේශක සභාවට තෝරා පත්කර ගත් බව පක්ෂ සභාපති හෝ මහලේකම් විසින් දැනුම් දුන්විට ඔහු පක්ෂ සාමාජිකත්වය ලබා ගත්තා සේ සැලකේ.

14-1-9 යම් සාමාජිකයෙකුට වර්ෂ දහයක සාමාජික මුදල් එක්වර ගෙවීමෙන් යාවජීව සාමාජිකයෙකු බවට පත්විය හැක.

14-1-10 යාවජීව සාමාජිකයා විසින් වාර්ෂිකව සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය අළුත් කිරීම කළ යුතු නොවේ.

14-1-11 යාවජීව සාමාජිකයා ද පක්ෂ විනයට යටත් වන අතර පක්ෂ විනය කඩ කිරීමට ඔහු වරදකරු වුවහොත් පක්ෂ සාමාජිකත්වයෙන් ඔහුව නෙරපීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

14-2 පක්ෂ සාමාජිකයෙකුගේ යුතුකම් හා වගකීම්

14-2-1 පක්ෂ ව්‍යවස්ථාව සහ ඒ යටතේ කලින් කලට පනවනු ලබන සියළුම රීති අනුගමනය කිරීම.

14-2-2 පක්ෂ උපදේශක සභාව සහ මධ්‍යම කාරක සභාව ඇතුළු නිල ආයතනවලින් කරන නියෝග පිළිපැදීම

14-2-3 පක්ෂයේ අරමුණු සහ ප්‍රතිපත්ති පිළිගැනීම සහ ප්‍රවර්ධනය කිරීම

14-2-4 පක්ෂයේ අරමුණු සහ ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රියාකරකම් ප්‍රසිද්ධියේ විවේචනය කිරීමෙන් වැළකීම

14-2-5 යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමක දී පක්ෂය විසින් නම් කරනු ලබන අපේක්ෂකයින්ට හැකි උපරිම අයුරින් සහය පළ කිරීම සහ වෙනත් තරඟකාරී අපේක්ෂකයින්ට සහය පළ කිරීමෙන් වැළකී සිටීම.

14-2-6 යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමකදී පක්ෂය විසින් අපේක්ෂකයින් නම් නොකර ඇති අවස්ථාවක පක්ෂය නිළ වශයෙන් වෙනත් යම් අපේක්ෂකයෙකුට සහය පළ කරන්නේ නම් පමණක් එකී අපේක්ෂකයාට සහය පළ කළ යුතු අතර නොඑසේ නම් මධ්‍යස්ථව සිටීම හෝ මධ්‍යම කාරක සභාව විසින් දෙනු ලබන විධානයන්ට අනුකූලව ක්‍රියාකිරීම

14-2-7 පක්ෂයේ අරමුණු සහ ප්‍රතිපත්ති සමඟ ගැටෙන හෝ ගැටීමට ඉඩ ඇති යම් දේශපාලන හෝ වෙනත් කටයුත්තකට සහභාගිවීමෙන් හෝ සහය පළ කිරීමෙන් වැළකී සිටීම.

14-2-8 පක්ෂය අපකීර්තියට පත්වන අයුරින් ක්‍රියා නොකිරීම.

14-2-9 පක්ෂ සාමාජිකයෙකුට අනුචිත අයුරින් හැසිරීමෙන් වැළකීම.

**14.3 පක්ෂ සාමාජිකයෙකුගේ බලතල සහ අයිතිවාසිකම්**

14-3-1 පක්ෂය විසින් නියම කරන යම් ගාස්තුවක් වෙතොත් එකී ගාස්තුව ගෙවා පක්ෂයේ ව්‍යවස්ථාවේ හෝ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපත් ලබාගැනීම.

14-3-2 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයට සහභාගිවීම.

14-3-3 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයක් කැඳවන මෙන් ඉල්ලීම.

14-3-4 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයක දී ඡන්දය ප්‍රකාශයට පත් කිරීම.

14-3-5 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයකට යෝජනා ඉදිරිපත් කිරීම.

14-3-6 පක්ෂ නායකත්වයට යෝජනා හෝ ප්‍රශ්න ඉදිරිපත් කිරීම සහ ඒවාට දින 30 ක් ඇතුලත පිළිතුරු ලබාගැනීම.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

14-3-7 මැතිවරණයන්හි දී පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම.

14.4 මතු දැක්වෙන අවස්ථා එකක් කීපයක් හෝ සියල්ලම යම් සාමාජිකයෙකු අරභයා උද්ගත වුවහොත් එකී අවස්ථාව උද්ගත වන මොහොතේම එකී සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වන්නේය.

14.4.1 ඉහත 14.1.2 හි දැක්වෙන ආකාරයට වෙනත් පක්ෂයක සාමාජිකත්වය දරමින් සිටියදී පක්ෂ සාමාජිකත්වය ලබාගෙන දින 30 ක් ඇතුලත ඔහු අදාළ දේශපාලන පක්ෂයෙන් ඉවත් නොවීම.

14.4.2 යම් වර්ෂයකම මාර්තු 31 දිනට පෙර වාර්ෂික සාමාජික මුදල් ගෙවීම පැහැර හැරීම.

14.4.3 වෙනත් දේශපාලන පක්ෂයක හෝ දේශපාලන සංධානයක සාමාජිකත්වය හෝ නිලතල ලබාගැනීම.

14.4.4 මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය නියෝජනය කරමින් දේශපාලන සංධානයකට එක්වීම.

14.4.5 මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සංධානයක් හෝ ස්වාධින කණ්ඩායමක් හෝ තමන්ව නියෝජනය කරමින් ජනාධිපති ධූරය හෝ මහජන නියෝජිත මණ්ඩලයක සභික ධූරයක් ලබාගැනීම සඳහා තරග කිරීමට නාමයෝජනා ලබාගැනීම.

14.4.6 මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව ජාතික ලැයිස්තුව හෝ වෙනත් වක්‍ර ක්‍රමයකින් වෙනත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධින කණ්ඩායමක් නියෝජනය කරමින් මහජන නියෝජිත මණ්ඩලයක සභික ධූරයක් ලබාගැනීම.

14.4.7 මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය විසින් ඍජුව හෝ සංධානගතව නොපිහිටුවන ලද ආණ්ඩුවක, පළාත් සභාවක, නගර සභාවක, ප්‍රාදේශිය සභාවක හෝ වෙනත් මහජන නියෝජිත ආයතනයක අගමැති, කථානායක, ඇමැති, නියෝජ්‍ය ඇමැති, නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති හෝ වෙනත් එවැනි තනතුරක් භාර ගැනීම.

14.4.8 රජයේ සේවකයෙකු නොවෙමින් මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය විසින් ඍජුව හෝ සංධානගතව නොපිහිටුවන ලද ආණ්ඩුවක් මගින් පාලනය වන සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් එවැනි ආයතනයක සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, අධ්‍යක්ෂක හෝ වෙනත් එවැනි තනතුරක් භාර ගැනීම.

14.4.9 රජයේ සේවකයෙකු නොවෙමින් මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය විසින් ඍජුව හෝ සංධානගතව නොපිහිටුවන ලද ආණ්ඩුවක නියෝජිතයෙකු ලෙස හෝ ආණ්ඩුව මගින් නම් කරන ලද සභිකයෙකු ලෙස හෝ සමාගමක, උපදේශක සභාවක හෝ ජාත්‍යන්තර සංවිධානයක තනතුරක් භාර ගැනීම.

14.5 පක්ෂ සාමාජිකත්වයට අදාළ රීතින් කලින් කලට මධ්‍යම කාරක සභාව විසින් පනවනු ලබන්නේය.

14.6 යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන්, අස් කිරීමෙන්, සාමාජිකත්වය අහෝසි වීමෙන් හෝ වෙනත් ආකාරයින් සාමාජිකත්වය අහිමි වුවහොත් ඔහු විසින් පක්ෂයේ දැරූ තනතුරු ද පක්ෂය නියෝජනය කරමින් දැරූ තනතුරු ද ඉබේම අහිමි වෙනු ඇත. ඒ සම්බන්ධයෙන් යම් පාර්ශවයකට හෝ ආයතනයකට හෝ සංවිධානයකට දැනුම් දියයුතු නම් පක්ෂ ලේකම් විසින් එය නොපමාව කළ යුතුය.

**ජාතික හෙළ උරුමය**
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## 15 විනය

15.1 යම් සාමාජිකයෙකු විසින් මතු දක්වෙන ක්‍රියා එකක්, කිහිපයක් හෝ සියල්ලම කර ඇතැයි ඔප්පු වුවහොත් එකී සාමාජිකයා පක්ෂයේ විනය කඩ කිරීමට වරදකරු වේ.

15.1.1 පක්ෂ ව්‍යවස්ථාව කඩ කිරීම

15.1.2 පක්ෂයේ නිල ආයතන විසින් ගන්නා තීරණයන්ට පටගැනිව කටයුතු කිරීම

15.1.3 පක්ෂයේ නිල ආයතන විසින් කරනු ලබන නියෝග පිළි නොපැදීම

15.1.4 යම් දේශපාලන පක්ෂයක් හෝ යම් දේශපාලන සංවිධානයක් විසින් සංවිධානය කළ රැස්වීමකට, උද්ඝෝෂණයකට, පෙලපාලියකට හෝ වෙනත් එවැනි කටයුත්තකට පක්ෂයේ සභාපති ලේකම් හෝ වෙනත් එවැනි බලය පවරන ලද නිලධාරියෙක් යන අයගෙන් කවරෙකුගෙන් හෝ ලිඛිත අවසරයක් ලබා නොගෙන සහභාගී වීම.

15.1.5 යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමක දී පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව වෙනත් පක්ෂයකට හෝ වෙනත් පක්ෂයක අපේක්ෂකයෙකුට සහය පළ කිරීම.

15.1.6 පක්ෂ නායකත්වය හෝ පක්ෂයේ ප්‍රතිපත්ති හෝ තීරණ හෝ ක්‍රියාකාරකම් ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ එසේ කිරීමට වෙනත් අයෙකු පෙළඹවීම හෝ අනුබලදීම.

15.1.7 පක්ෂය අපකීර්තියට පත්වන ආකාරයෙන් හැසිරීම.

15.1.8 පක්ෂ සාමාජිකයෙකුට අනුචිත අයුරින් හැසිරීම.

15.2 යම් සාමාජිකයෙකු විසින් විනය කඩ කර ඇතිබවට විශ්වාසනීය තොරතුරු මධ්‍යම කාරක සභාවට පැමිණිල්ලක් මගින් හෝ අන්‍යාකාරයකට ලැබී ඇති වට ඒ තොරතුරු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විනය කමිටුවට ලිඛිතව දැනුම් දිය යුතුය.

15.3 විනය කමිටුව විසින් එකී චෝදනාව විමර්ශනය කර මධ්‍යම කාරක සභාවට වාර්තා කිරීම සඳහා විනය කමිටුවේ සාමාජිකයින් අතුරින් තිදෙනෙකුගෙන් යුත් පරීක්ෂණ සභාවක් පත් කළ යුතුය.

15.3.1 විනය පරීක්ෂණ කමිටුවේ සාමාජිකයින් අතුරෙන් එක් අයෙකු එහි සභාපතිවරයා ලෙස විනය කමිටුව විසින් පත් කළ යුතුය.

15.3.2 චෝදනාවන්ට ලක්ව ඇති සාමාජිකයා භික්ෂුන් වහන්සේ නමක් නම් එකී විනය පරීක්ෂණ සභාවේ සභාපති භික්ෂුන් වහන්සේ නමක් විය යුතුය.

15.3.3 විනය පරීක්ෂණ සභාවට පත්කළ බවට එහි සාමාජිකයින්ට දැනුම් දෙන ලිපියේ චූදිත සාමාජිකයාගේ නම සහ ලිපිනය ද විනය පරීක්ෂණ සභාවේ වාර්තාව දින 50 ක් ඇතුලත මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතු බව ද සඳහන් කළ යුතුය.

15.3.4 චූදිත සාමාජිකයාට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරු ද එකී ලිපිය සමග විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට ලබාදිය යුතුය.

15.4 එකී විනය පරීක්ෂණ සභාව විසින් සාමාජිකයාට එරෙහිව ඇති තොරතුරු ඇතුලත් චෝදනා පිළිබඳ සුදුසු යැයි සලකන පරිදි පරීක්ෂණ කටයුතු සිදුකරමින් එකී චෝදනා පිළිබඳ තොරතුරු රැස් කළ යුතුය.

15.5 එකී සාමාජිකයාට එරෙහිව විනය කටයුතු ඇරඹීමට ප්‍රමාණවත් හේතු ඇති බවට පරීක්ෂණ සභාව සෑහීමකට පත්වේ නම් එකී සාමාජිකයාට එරෙහිව චෝදනා පත්‍රයක් සකස් කළ යුතුය.

15.5.1 එකී චෝදනා පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් චූදිත සාමාජිකයාට යැවිය යුතුය.

15.5.2 එකී චෝදනා පත්‍රය දැක්වෙන දිනයේදීම එය තැපැල් කළ යුතුය.

15.5.3 එකී චෝදනා පත්‍රයේ දැක්වෙන දිනයට පසු දිනයක තැපැල් කළේ නම් එකී දිනය චෝදනා පත්‍රයේ දිනය ලෙස සැලකේ.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

15.5.4 එකී චෝදනා පිළිබඳ යම් නිදහසට කරුණු දැක්වීමක් කරන්නේ නම් එය චෝදනා පත්‍රයේ දිනයේ සිට දින 14 ක් ඇතුලත විනය පරික්ෂණ සභාවේ සභාපතිවරයාට ලිඛිතව එවිය යුතුය බව දැන්විය යුතුය.

15.5.5 චෝදනා පත්‍රයට විනය පරික්ෂණ සභාවේ සභාපතිවරයා අත්සන් කළ යුතුය. ඔහු වෙනුවෙන් එකී සභාවේ සාමාජිකයෙකුට ද අත්සන් කළ හැක.

15.6 යම් චුදිත සාමාජිකයෙකු ලබාදෙන ලද කාල සීමාව තුළ නිදහසට කරුණු දැක්වීමක් නොකලොත් ඔහුට එකී චෝදනා පිළිබඳ නිදහසට දැක්වීමට කාරණා නොමැති බව විනය පරික්ෂණ සභාව නිගමනය කළ යුතුය.

15.7 විනය පරික්ෂණ සභාව විසින් සිය අභිමතය පරිදි යම් චුදිත සාමාජිකයෙකුට නිදහසට කරුණු දැක්වීමට ලබාදුන් කාලය වරක් හෝ ඊට වැඩි වාරයක් දීර්ඝ කළ හැකි නමුත් එසේ කරණු ලබන සියළුම දීර්ඝ කිරීම් දින දහ හතර (14) ක් නොඉක්මවිය යුතුය.

15.8 නිදහසට කරුණු දැක්වීමට ලබාදුන් කාලය ඉක්ම යෑමෙන් පසු විනය පරික්ෂණ සභාව විසින් සාමාජිකයාට එරෙහිව නගන ලද චෝදනා, එකී චෝදනා සනාථ කිරීමට ලැබී තිබුණු සාක්ෂි එකී චෝදනා සම්බන්ධයෙන් චුදිත සාමාජිකයා විසින් නිදහසට කාරණා දක්වා ඇත්නම් එසේ දක්වන ලද නිදහසට කාරණා, එක් එක් චෝදනාවට වැරදිකරු ද නිවැරදිකරුද යන්න පිළිබඳ සභාවේ නිගමනය යන කාරණා අඩංගු වාර්තාවක් හැකි ඉක්මණින් සකස් කර මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතුය.

15.8.1 චුදිත සාමාජිකයාට එරෙහිව රැස්කර ගන්නා ලද සියළුම සාක්ෂි ද චුදිත සාමාජිකයා විසින් එවන ලද නිදහසට කරුණු දැක්වීම ද එකී වාර්තාවට ඇමිණිය යුතුය.

15.8.2 එකී වාර්තාවට විනය පරික්ෂණ සභාවේ සියළුම සාමාජිකයින් විසින් අත්සන් කළ යුතුය.

15.8.3 යම් සාමාජිකයෙකු විසින් බහුතර තීරණයට එකඟ නොවන්නේ නම් ඒ බව වාර්තාවේ සඳහන් කරමින් ඔහු ද වාර්තාවට අත්සන් තැබිය යුතුය.

15.9 විනය පරික්ෂණය පැවැත්වෙන අතරේ දී විනය පරික්ෂණ සභාවේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් විනය කමිටුවේ සභාපති විසින් විනය කමිටුවේ සාමාජිකයින් අතුරෙන් එකී පුරප්පාඩුව පිරවිය යුතුය.

17.9.1 එකී පුරප්පාඩුව පුරවන තෙක් විනය පරික්ෂණ සභාවේ කටයුතු අත්හිටුවිය යුතුය.

17.9.2 එකී පුරප්පාඩුව ඇතිවී දින තුනක් ඇතුලත එය පිරවිය යුතුය.

17.9.3 පුරප්පාඩුව ඇති වෙන විට විනය පරික්ෂණය පැවැත්වූ තැන සිට පුරප්පාඩු පිරවීමෙන් පසු නැවත කටයුතු ඇරඹිය යුතුය.

15.10 චුදිත සාමාජිකයා පිළිබඳ විනය පරික්ෂණ වාර්තාව සළකා බැලෙන මධ්‍යම කාරක සභාව කැඳවන ලිපියේ එකී වාර්තාව සළකා බැලෙන බව දැනුම් දිය යුතු අතර එකී වාර්තාවේ පිටපතක් රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් පැය 48 කට පෙර සෑම මධ්‍යම කාරක සභිකයෙකුටම ලබාදිය යුතුය.

15.11 මධ්‍යම කාරක සභාව විසින් විනය පරික්ෂණ සභාවේ වාර්තාව සහ ඒ ආශ්‍රිත අනෙකුත් ලියවිලි අධ්‍යයනය කිරීමෙන් පසු

15.11.1 චුදිත සාමාජිකයා සියළුම චෝදනාවන්ට නිවැරදිකරු යැයි විනය පරික්ෂණ සභාව විසින් නිගමන කර ඇත්නම් ඔහුව සියළුම චෝදනාවලින් නිදහස් කළ යුතුය.

15.11.2 චුදිත සාමාජිකයා යම් චෝදනාවකට වැරදිකරු යැයි විනය පරික්ෂණ සභාව නිගමනය කර ඇත්නම් එකී සාමාජිකයාට පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම ද ඇතුළුව මධ්‍යම කාරක සභාවට සුදුසු යැයි හැගෙන දඬුවමක් පැණවිය යුතුය.

15.11.3 චුදිත සාමාජිකයා විසින් තම වැරැද්ද පිළිගෙන එයට සමාව අයැද අනාගතයේදී එවැනි වැරදි නොකරන බවට ලිඛිත පොරොන්දුවක් පක්ෂ මහලේකම්ට ලබාදී එකී ලියවිල්ල සභාගත කළේ නම් විනය පරික්ෂණ සභාව විසින් යම් චෝදනාවකට වැරදිකරු යැයි නිගමනය කර තිබුණත් ඔහුට දඬුවම් නොපැනවීමට තීරණය කළ හැක. එකී තීරණය නොපැමිණි සාමාජිකයින්ද ඇතුළුව

මධ්‍යම කරක සභාවේ තුනෙන් දෙකක බහුතරයක් විසින් අනුමත කළ යුතු අතර උපදේශක මණ්ඩලය විසින් එකමතිකව සම්මත කළ යුතුය.

15.11.4 චූදිත සාමාජිකයා වැරදිකරුද නිවැරදිකරුද යන වග තීරණය කිරීම පිණිස ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලයක් මගින් සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි මෙහෙයවන පරීක්ෂණයක් පැවැත්විය යුතු බව මධ්‍යම කාරක සභාවේ මතය වනවට එවැනි ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලයක් පත් කර එකී චෝදනා යොමු කළ යුතුය.

15.12 මධ්‍යම කාරක සභාව විසින් ඉහත 15-11-4 හි දැක්වෙන් අයුරින් කටයුතු කිරීමට තීරණය කළ විට පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ හෝ උපදේශක සභාවේ සාමාජිකයින් නොවන තිදෙනෙක් ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලය ලෙස පත් කළ යුතුය.

15.12.1 එකී මණ්ලයේ සභාපතිවරයාද මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

15.12.2 චූදිත සාමාජිකයා භික්ෂුන් වහන්සේ නමක් නම් එකී ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා භික්ෂුන් වහන්සේ නමක් විය යුතුය.

15.12.3 පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙකු හෝ සේවකයෙකු හෝ පූර්ණකාලික ක්‍රියාදරයෙකු එකී මණ්ඩලයේ ලේකම්වරයා ලෙස මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

15.12.4 එකී පත්වීම් හැකි ඉක්මණින් පක්ෂයේ ලේකම්වරයා විසින් පත්වීම් ලාභින්ට දැනුම්දිය යුතුය.

15.12.5 පත්වීම් ලිපි සමග චෝදනා පත්‍රයේ පිටපත් ද චූදිත සාමාජිකයා විසින් නිදහසට කරුණු දක්වා ඇත්නම් එසේ දක්වන ලද කරුණු ද පත්වීම් ලාභින්ට ලබා දියයුතුය.

15.12.6 පක්ෂයේ ලේකම්වරයාට අවශ්‍ය යැයි හැගේනම් විනය පරික්ෂණ සභාව විසින් සකස් කළ චෝදනා පත්‍රයට චෝදනා එකතු කිරීම් ඉවත් කිරීම් හා වෙනස් කිරීම් ඇතුලු ඕනෑම සංශෝධනයක් කළ හැක.

15.12.7 චූදිත සාමාජිකයාට එරෙහිව ඇති චෝදනා විභාග කිරීමට ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලයකට යොමු කළ බවත් එහි ලේකම්වරයා විසින් ඉදිරියේදී එහි කටයුතු පිළිබඳ දැනුම් දෙනු ඇති බවත් පක්ෂ ලේකම් විසින් චූදිත සාමාජිකයාට දන්වමින් ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවිය යුතු අතර ස්වාධීන විනය පරික්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් ලේකම්ගේ නම සහ සංශෝධිත චෝදනා පත්‍රය ද එකී ලිපියට අඩංගු විය යුතුය. නැතහොත් චෝදනා පත්‍රය වෙනස් කර නොමැති බව දැන්විය යුතුය.

15.12.8 චෝදනා පත්‍රය සංශෝධනය කිරීමේ දී චෝදනා එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් කර ඇත්නම් එකී චෝදනාවන්ට නිදහසට කරුණු දක්වා සති දෙකක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් මණ්ඩලයේ ලේකම්ට එවන මෙන් චූදිත සාමාජිකයාට දැනුම් දිය යුතුය.

15.13 ඉහත 15-12-7 හි දැක්වෙන ලිපිය චූදිත සාමාජිකයාට යැවූ බවට එකී ලිපියේ සහ ලියාපදිංචි තැපෑල් කුවිතාන්සියේ පිටපත් පක්ෂයේ ලේකම් විසින් මණ්ඩලයේ ලේකම්ට ලබාදුන් පසු මණ්ඩලයේ සාමාජිකයින් සමග සාකච්ඡා කර විනය පරික්ෂණය පැවැත්වීමට ස්ථානයක් දිනයක් සහ වේලාවක් නියම කළ යුතුය.

15.14 එකී දිනයේ එකී වේලාවට එකී ස්ථානයේ විනය පරික්ෂණය ඇරඹෙන බවට ලියාපදිංචි තැපෑලෙන් පක්ෂ ලේකම්ට සහ චූදිත සාමාජිකයාට මණ්ඩලයේ ලේකම් විසින් දැනුම්දිය යුතුය.

15.14.1 විනය පරික්ෂණය අරඹන දිනය සහ දැනුම් දීමේ ලිපි තැපෑල් කරන දිනය අතර අවම වශයෙන් දින දහ හතරක පරතරයක් තිබිය යුතුය.

15.14.2 අදාළ සාක්ෂිකරුවන්ට දැනුම් දිම කළ යුත්තේ පක්ෂ මහලේකම්වරයාය.

15.15 විනය පරික්ෂණ පැවැත්වීමට අවශ්‍ය අරමුදල් පක්ෂයේ භාණ්ඩාගාරික විසින් එකී මණ්ඩලයේ ලේකම්ට නොපමාව ලබාදිය යුතුය.

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

15.16 විනය පරීක්ෂණයේ දෛනික කටයුතු පිළිබඳ වාර්තාවක් තබා ගැනීම මණ්ඩලයේ ලේකම්වරයාගේ වගකීමක් වන්නේය.

15.17 ස්වාභාවික යුක්තියේ මූලධර්මවලට අනුකූලව විනය පරීක්ෂණය පවත්වන ආකාරය තීරණය කිරීමට ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලයට බලය තිබේ.

15.18 එකී මණ්ඩලය විසින් විනය පරීක්ෂණය පවත්වන අතරතුරේදී මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් එකී පුරප්පාඩු පිරවීමට ප්‍රමුඛතා අනුපිළිවෙළට අතිරේක සාමාජිකයින් දෙදෙනෙක් ද මධ්‍යම කාරක සභාව විසින් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය පත් කරන අවස්ථාවේම නම් කළ යුතු අතර යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් එකී නම් අතුරෙන් එම පුරප්පාඩුව පිරවීමට පක්ෂයේ ලේකම්ට බලය පැවරිය යුතුය. එකී අතිරේක සාමාජිකයින්ගෙන් පුරප්පාඩු පිරවිය නොහැකි අවස්ථාවක මධ්‍යම කාරක සභාව විසින් පුරප්පාඩු පිරවිය යුතුය.

15.18.1 එකී පුරප්පාඩුව පුරවන තෙක් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු අත්හිටුවිය යුතුය.

15.18.2 එකී පුරප්පාඩුව ඇතිවී දින පහක් ඇතුලත එය පිරවිය යුතුය.

15.18.3 පුරප්පාඩුව ඇතිවෙන විට විනය පරීක්ෂණ නැවැත්වූ තැන සිට පුරප්පාඩු පිරවීමෙන් පසු නැවත කටයුතු ඇරඹිය යුතුය.

15.19 විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු සිය නිගමන දැක්වෙන වාර්තාවක් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය විසින් පක්ෂයේ මහලේකම් මගින් මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතුය.

15.19.1 එකී වාර්තාවේ ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයේ නම්, පැමිණිලි පාර්ශවය සහ එහි සාක්ෂිකරුවන්, චූදිත සාමාජිකයාගේ නම සහ පක්ෂයේ දරණ තනතුර විනය පරීක්ෂණය පැවැත්වූ ආකාරය, සාමාජිකයාට එරෙහිව නගන ලද චෝදනා එකී චෝදනා සනාථ කිරීමට ලැබී තිබුණු සාක්ෂි, එකී චෝදනා සම්බන්ධයෙන් චූදිත සාමාජික විසින් දක්වන ලද නිදහසට කාරණා එක් එක් චෝදනාවට වැරදිකරු ද නිවැරදි කරුද යන්න පිළිබඳ මණ්ඩලයේ නිගමනය යන කාරණා අඩංගු විය යුතුය.

15.19.2 එකී වාර්තාවට එකී මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම අත්සන් කළ යුතුය. යම් සාමාජිකයෙකුට බහුතරයේ තීරණයට එකඟ විය නොහැකි නම් ඒ බව සඳහන් කර වාර්තාවට අත්සන් තැබිය යුතුය.

15.19.3 වාචික සාක්ෂි මෙහෙයවීම් ඇතුළු විනය පරීක්ෂණයේ දෛනික වාර්තා, පැමිණිල්ල, වග උත්තරකරු සහ මණ්ඩලයේ ලේකම් විසින් පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ ලේඛණ යනාදිය වාර්තාවේ උපලේඛණ ලෙස එක් කළ යුතුය.

15.20 චූදිත සාමාජිකයා පිළිබඳ ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සළකා බැලෙන මධ්‍යම කාරක සභාව කැඳවන ලිපියේ එකී වාර්තාව සළකා බැලෙන බව දැනුම් දිය යුතු අතර එකී වාර්තාවේ පිටපතක් රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් පැය 48 කට පෙර සෑම මධ්‍යම කාරක සභිකයෙකුටම ලබාදිය යුතුය.

15.21 මධ්‍යම කාරක සභාව විසින් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සහ ඒ ආශ්‍රිත අනෙකුත් ලියවිලි අධ්‍යයනය කිරීමෙන් පසු

15.21.1 චූදිත සාමාජිකයා සියළුම චෝදනාවන්ට නිවැරදිකරු යැයි ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය විසින් නිගමනය කර ඇත්නම් ඔහුව සියළුම චෝදනාවලින් නිදහස් කළ යුතුය.

15.21.2 චූදිත සාමාජිකයා යම් චෝදනාවකට වැරදිකරු යැයි ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය නිගමනය කර ඇත්නම් එකී සාමාජිකයාට පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම ද ඇතුළුව මධ්‍යම කාරක සභාවට සුදුසු යැයි හැගෙන දඩුවමක් පැමිණිවිය යුතුය.

15.21.3 චූදිත සාමාජිකයා විසින් තම වැරැද්ද පිළිගෙන එයට සමාව අයැද අනාගතයේදී එවැනි වැරදි නොකරන බවට ලිඛිත පොරොන්දුවක් පක්ෂ මහලේකම්ට ලබාදී එකී ලියවිල්ල සභාගත කළේ නම් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය විසින් යම් චෝදනාවකට වැරදිකරු යැයි නිගමනය

ජාතික ... පෙරමුණ
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

කර තිබුණත් ඔහුට දඩුවම් නොපැනවීමට තීරණය කළ හැක එකී තීරණය නොපැමිණි සාමාජිකයන්ද ඇතුළුව මධ්‍යම කාරක සභාවේ තුනෙන් දෙකක බහුතරයක් විසින් අනුමත කළ යුතු අතර උපදේශක සභාව විසින් ඒකමතිකව සම්මත කළ යුතුය.

15.22 යම් සාමාජිකයෙකු විසින් විනය කඩ කිරීමක් පිළිබඳ විමර්ශනය කරන මෙන් විනය මණ්ඩලයේ සභාපතිට මධ්‍යම කාරක සභාව විසින් දැනුම් දීමෙන් පසු එකී සාමාජිකයා පිළිබඳ විනය පරීක්ෂණ අවසන් වන තෙක් කාල පරාසය තුළ නිදහසට කරුණු විමසීමකින් තොරව එකී සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට මධ්‍යම කාරක සභාවට හැක.

15.23 පක්ෂ සාමාජිකයෙක් විසින් විනය කඩ කිරීම පිළිබඳ මධ්‍යම කාරක සභාව ගන්නා ඕනෑම තීරණයක් අවසාන තීරණය වේ.

## 16. පක්ෂයේ දේපොල හා මූල්‍ය කටයුතු

16.1 වාර්ෂිකව අය වැය වාර්තාවක් සකස් කළ යුතු අතර එය ජාතික මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

16.2 මුදල් වර්ෂය ජනවාරි මස පළමු දිනෙන් ඇරඹී දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වේ.

16.2.1 පක්ෂයේ අය වැය සැකසීම, ගිණුම් තැබීම සහ අවශ්‍යතා මත මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම භාණ්ඩාගාරිකගේ වගකීමකි.

16.2.2 පක්ෂයේ ගිණුම මධ්‍යම කාරක සභාව විසින් නම් කරන ස්වාධීන වරලත් විගණකවරයෙකුගේ විගණයට ලක් කළ යුතුවේ.

18.2.3 පක්ෂයට යම් දේපොලක් ඇත්නම් එය භාණ්ඩාගාරිකවරයා සාමාජිකයෙකු වන මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්වූ භාරකාර මණ්ඩලයකින් පාලනය විය යුතුය.

16.2.4 පක්ෂයේ පොදු ගිණුම පවත්වා ගැනීමේ රීති මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

16.2.5 පක්ෂය සඳහා අරමුදල් සාමාජික අරමුදල්, පරිත්‍යාග හා වෙනත් ධාර්මික ක්‍රියාවලින් උපයාගන්නා ධනය රැස්කළ යුතුය.

## 17 ව්‍යවස්ථාව සංශෝධනය

17.1 ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුට ඉදිරිපත් කළ හැකිය.

17.2 මධ්‍යම කාරක සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් ව්‍යවස්ථා සංශෝධන මණ්ඩලයක් පත් කරනු ලැබේ.

17.3 ව්‍යවස්ථා සංශෝධන යෝජනා, ඒවා සමාලේචනය සඳහා රැස්කරන විශේෂ මධ්‍යම කාරක සභාවකදී සමස්ත සාමාජිකයින් 2/3 කගේ අනුමත කිරීමෙන් අනතුරුව පක්ෂ සම්මේලනයේ දී අනුමත විය යුතුය.

17.4 ව්‍යවස්ථා සංශෝධන යෝජනා සමාලෝචනය සඳහා රැස්කරන විශේෂ මධ්‍යම කාරක සභා රැස්වීමේ ක්‍රියා පටිපාටිය මධ්‍යම කාරක සභා රැස්වීමේදී අනුමත කරනු ඇත.

## 18 අන්තර් කාලීන විධිවිධාන

18.1 මෙම ව්‍යවස්ථාවේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද මෙම ව්‍යවස්ථාව සම්මත වීමෙන් පසු පළමු වරට පත්වන සියළුම නිළධාරින් සහ ආයතන සම්බන්ධයෙන් අදාළ වන්නේ මතු දැක්වෙන විධිවිධානයන්ය.

18.1.1 මෙම ව්‍යවස්ථාවේ සම්මත කරන පක්ෂ සම්මේලනය කැඳවන මධ්‍යම කාරක සභාව විසින් මතු දැක්වෙන තනතුරු සහ ආයතන සඳහා පුද්ගලයින්ගේ නම් නිර්දේශ කර එකී නිර්දේශිත නම් එකී පක්ෂ සම්මේලනයේදී ප්‍රකාශයට පත් කර අනුමත කර ගත යුතුය.

අ) පක්ෂයේ නිළධාරින්

ආ) උත්තර සංඝ මණ්ඩලය

ඇ) මධ්‍යම කාරක සභාව


18.1.2 අනෙකුත් සියළුම ආයතන සහ නිලයන්ට පුද්ගලයින් පත් කළ යුත්තේ නව ව්‍යවස්ථාවේ විධිවිධනා අනුවය.

18.2 මෙම ව්‍යවස්ථාව සම්මත වනවිට යම් සාමාජිකටයකුට එරෙහිව පක්ෂය විසින් විනය පරික්ෂණයක් පැවැත්විම හෝ විනය පරික්ෂණයක් පැවැත්වීමට තොරතුරු රැස් කිරීම හෝ අරඹා තිබුනේ නම් එකී විනය පරික්ෂණය පැවැත්විම දඬුවම් නිර්දේශ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල වන්නේ මෙම ව්‍යවස්ථාව සම්මත වීමට පෙර බල පැවති ව්‍යවස්ථාවේ විධිවිධානය.

## 19 පෙර ව්‍යවස්ථාව පරිච්ජින්න කිරීම

වර්ෂ 2004 ක් වු මැයි මස 25 දින පැවැත් වු පක්ෂ සම්මේලනයේදී සම්මත වීමෙන් ක්‍රියාත්මක වුණු පක්ෂ ව්‍යවස්ථාව මෙයින් පරිච්ජින්නවේ .

## පළමු උපලේඛනය.



හක්ගෙඩිය.

සත්‍ය පිටපතකි

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

දෙවන උපලේඛණය

# ජාතික හෙළ උරුමය

## සාමාජික ප්‍රතිඥාව

...................................................... වන මම ජාතික හෙළ උරුමයේ සාමාජිකයෙකු වශයෙන් එහි ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවෙනබවටත් පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය නොකරන බවටත් පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඇතුළු පක්ෂයේ විවිධ ආයතනමගින් කලින් කලට පනවන නියෝගයන්ට සහ අතුරු ව්‍යවස්ථාවන්ට අවනත වී අනුගමනය කරන බවටත් පක්ෂය විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට උපරිම සහයෝගය ලබාදෙන බවටත් පක්ෂයට අවමන් වෙන ආකාරයට හෝ පක්ෂ සාමාජිකයෙකුට අනුචිත ආකාරයටකට කටයුතු නොකරන බවටත් බෞද්ධයෙකු / .............................. වශයෙන් අවංකවත් සත්‍ය ලෙසත් ගාම්භීර පූර්වකවත් ප්‍රතිඥා / දිවුරුම් දී ප්‍රකාශ කර සිටිමි.

..................................
සාමාජිකයාගේ අත්සන

..................................
දිනය

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

## තෙවන උපලේඛනය

## ජාතික හෙළ උරුමය

## මහජන නියෝජිත ප්‍රතිඥාව

.............................................. හි පදිංචි .............................................. වන මම ජාතික හෙළ උරුමයේ මහජන ........................................................................ නියෝජිතයෙකු වශයෙන්

- එහි ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවෙන බවටත්
- පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝණය නොකරන බවටත්
- පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඇතුළු පක්ෂයේ විවිධ ආයතන මගින කලින් කලට පනවන නියෝගයන්ට සහ අතුරු ව්‍යවස්ථාවන්ට අවනත වී අනුගමනය කරන බවටත්
- පක්ෂයේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයකට ආධාර, උපකාර හෝ අනුබල නොදෙන බවටත්
- පක්ෂයේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව පාර්ලිමේන්තුව, පළාත් සභාව, ප්‍රාදේශිය සභාව ඇතුළු කිසිම මහජන නියෝජිත ආයතනයක අගමැති ධුරය, කතානායක ධුරය, අමාත්‍ය ධුර ද ඇතුළුව කිසිම තනතුරක් භාර නොගන්නා බවටත්
- මහජන නියෝජිතායතනයන්හි ඡන්ද විමසීම්හි දී පක්ෂයේ තීරණයන්ට අනුව කටයුතු කරන බවටත්
- පක්ෂය විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට උපරිම සහයෝගය ලබාදෙන බවටත්
- පක්ෂය අවමන්වන ආකාරයට හෝ පක්ෂ සාමාජිකයෙකුට අනුචිත ආකාරයකට කටයුතු නොකරන බවටත්

බෞද්ධයෙකු / ................ වශයෙන් අවංකවත් සත්‍ය ලෙසත් ගාම්භීර පූර්වකවත් ප්‍රතිඥා / දිවුරුම් දී ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් කරුණු දිවුරුම් ප්‍රකාශක )
කියවා තේරුම් ගැනීමෙන් අනතුරුව එහි )
සඳහන් කරුණු නිවැරදි බවට පිළිගෙන )
මා ඉදිරිපිට දී ..........ක්වූ ..........මස )
........දින................දී ප්‍රතිඥා දී අත්සන් තබන ලදී )

මහජන නියෝජිතයා
මා ඉදිරිපිට දී ය.

දිවුරුම් කොමසාරිස් / සාම විනිසුරු

ජාතික හෙළ උරුමය
964/2, පන්නිපිටිය පාර
බත්තරමුල්ල

2

## 01 ප්‍රගති සමාලෝචන කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක ජන සභාවේ නිළ මඩුල්ලේ නිළධාරීන් සත් දෙනා හා නිළ මඩුල්ලේ අභිමතයෙන් තෝරාගනු ලබන දිස්ත්‍රික්ක ජන සභිකයින් තුන් දෙනෙකුගෙන් සමන්විත යුත්තේය.

සභාපති - දිස්ත්‍රික්ක ජන සභා සභාපති හිමිනම

ලේකම් - කමිටුව මගින් තෝරාගැනෙයි

කාර්ය භාර්යයන්

01- 1 ආසන ජන සභා පැමිණිලි, චෝදනා, අඩුපාඩු හා දුර්වලතා විමර්ශනයට භාජනය කිරීම සහ ඒවා විසඳීම සඳහා කඩිනම් පියවර ගැනීම.

01 -2 ආසන ජන සභා ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

01- 3 දිස්ත්‍රික්ක ජන සභා කාර්ය සාධක කමිටු සම්බන්ධීකරණය කිරීම හා සමාලෝචනයට භාජනය කිරීම.

## 02 ප්‍රචාරක හා සන්නිවේදන කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක ජන සභා ගිහි සංවිධායක ඇතුළු ගිහි සභිකයින් දහඅට දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

සභාපති - දිස්ත්‍රික්ක ජන සභා ගිහි සංවිධායක

ලේකම් - කමිටුව මගින් තෝරා ගැනෙයි

කාර්ය භාර්යයන්

02-1 ප්‍රචාරක රැස්වීම් උද්ඝෝෂණ ආදිය සංවිධානය කිරීමේ වගකීම.

02-2 පෝස්ටර්, බැනර් හා පත්‍රිකා නිර්මාණය කිරීම.

02-3 පෝස්ටර්, බැනර්, පත්‍රිකා ආදිය මුද්‍රණය කිරීම බෙදාහැරීම, ප්‍රදර්ශණය කිරීම හා අධීක්ෂණය.

02-4 පූර්ව හා පශ්චාත් රැස්වීම් ප්‍රචාරක කටයුතු හා ජන මාධ්‍ය සම්බන්ධීකරණය

## 03 මූල්‍ය හා අරමුදල් කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක ජන සභා භාණ්ඩාගාරික හා ආසන ජන සභා සියලුම භාණ්ඩාගාරික වරුන් ඇතුළු දිස්ත්‍රික්ක ජන සභිකයින් දහඅට දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

සභාපති - දිස්ත්‍රික්ක ජන සභා භාණ්ඩාගාරික

ලේකම් - කමිටුව මගින් තෝරා ගැනෙයි

කාර්ය භාර්යයන්

03-1 දිස්ත්‍රික්ක ජන සභාව සඳහා මූල්‍ය සැළැස්මක් සකස් කිරීම.

03-2 දිස්ත්‍රික්ක ජන සභාවේ මූල්‍යමය ගනුදෙනු සමාලෝචනය කිරීම.

03-3 අරමුදල් රැස්කිරීමේ ක්‍රම උපායන් යෝජනා කිරීම හා ව්‍යාපෘති සැළසුම් කිරීම.

03-4 දිස්ත්‍රික්ක ජන සභා අනුමැතියෙන් අදාළ ව්‍යාපෘති සඳහා මූලිකත්වය ගැනීම සහ අධීක්ෂණය කිරීම.

## 04 සාමාජිකත්වය සහ තොරතුරු කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක ජන සභා ලේකම් ඇතුළු ගිහි සභිකයින් දහඅට දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

සභාපති - දිස්ත්‍රික්ක ජන සභා ලේකම්
ලේකම් - කමිටුව මගින් තෝරා ගැනෙයි

කාර්ය භාර්යයන්

04-1 දිස්ත්‍රික්ක ජන සභිකයිනගේ සහ ආයතන ජන සභාවල නිළධාරින්ගේ නම්, ලිපිනයන් ආදිය සකස් කිරීම.
04-2 සාමාජිකත්වය පිරිනැමීමේ කටයුතු.
04-3 මැතිවරණ දත්ත හා තොරතුරු රැස්කිරීම.
04-4 සාමාජිකයින් දැනුවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## 05 කාන්තා යොවුන් හා අධ්‍යාපන කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක ජන සභා නියෝජ්‍ය ලේකම්වරු දෙදෙනා ඇතුළු ගිහි සභිකයින් දහඅට දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

සභාපති - දිස්ත්‍රික්ක ජන සභා නියෝජ්‍ය ලේකම්
ලේකම් - කමිටුව මගින් තෝරා ගැනෙයි

කාර්ය භාර්යයන්

05-1 කාන්තා වැඩ සටහන් සංවිධාන කිරීම.
05-2 යොවුන් කටයුතු වැඩ සටහන් සංවිධානය කිරීම.
05-3 අධ්‍යාපන හා වැඩමුළු සංවිධානය කිරීම.
05-4 සුභ සාධක කටයුතු සංවිධානය කිරීම.

## 06 ආගමික හා ශාසනික කටයුතු කමිටුව

සංයුතිය - දිස්ත්‍රික්ක සභා පැවිදි සංවිධායක ඇතුළු ජන සභිකයින් දහඅට දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

සභාපති - පැවිදි සංවිධායක හිමි නම
ලේකම් - කමිටුව මගින් තෝරා ගැනෙයි

කාර්ය භාර්යයන්

06-1 දිස්ත්‍රික්කයේ විහාරස්ථාන හා සම්බන්ධි කරන කටයුතු.
06-2 ශාසනික හා ආගමික කටයුතු සංවිධානය කිරීම.
06-3 විහාරවාසී ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීම.
06-4 දිස්ත්‍රික්කයේ විහාරස්ථාන ලිපිනයන් හා නායක ස්වාමීන් වහන්සේලාගේ නාමාවලි සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.

dp/k

නිමි